## පුරවැසි - 9 ශ්‍රේණිය

# ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

- **ප්‍රජාතන්ත්‍රවාදය**

**ප්‍රජාතන්ත්‍රවාදය යනු,**

මහජනතාවගේ පාලනය නම් වේ. මහජනතාවගේ බහුතර කැමැත්ත මත ඔවුන් විසින් ගොඩ නගා ගනු ලබන පාලන ක්‍රමය **ප්‍රජාතන්ත්‍රවාදී පාලනය** ලෙස හැඳින්වේ.

- **ප්‍රජාතන්ත්‍රවාදය පිළිබඳ ඉදිරිපත් වී ඇති නිර්වචන**

මහජනයා විසින් මහජනයා උදෙසා ක්‍රියාත්මක කරනු ලබන මහජන පාලන ක්‍රමයකි.
- ඒබ්‍රහම් ලින්කන්

ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමය සියලු දෙනාටම අයිතිවාසිකම් හිමි වන පාලන ක්‍රමයකි.
- සීලර්

- **ප්‍රජාතන්ත්‍රවාදී ජීවන ක්‍රමයක ලක්ෂණ**

1. සෑම පුරවැසියෙකු ම තම යුතුකම් ඉටු කරමින් අයිතිවාසිකම් භුක්ති විඳීම
2. අන්‍ය මත ගරු කිරීම
3. සාකච්ඡා මගින් තීරණවලට එළඹීම
4. සමානාත්මතාව ගරු කිරීම

- **ප්‍රජාතන්ත්‍රවාදයේ මූලික ස්වරූප 2 කි.**
  1. සෘජු ප්‍රජාතන්ත්‍රවාදය
  2. වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

**සෘජු ප්‍රජාතන්ත්‍රවාදය**

තීන්දු ගැනීමේ ක්‍රියාවලියට හා පාලන කටයුතුවලට පුරවැසියන් සෘජුව සම්බන්ධ වීම සෘජු ප් රජාතන්ත්‍රවාදයයි.

**සෘජු ප්‍රජාතන්ත්‍රවාදය අතීතයේ ක්‍රියාත්මක කිරීම පහසු වීමට හේතු**

1. මිනිසාගේ අවශ්‍යතා සීමිත වීම
2. ජනගහනය සීමාසහිත වීම
3. එක් ස්ථානයකට එක් රැස්ව සාකච්ඡා කිරීම හා තීරණවලට එළඹීම පහසු වීම

**සෘජු ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක් ලෙස වර්තමානයේ ක්‍රියාත්මක කිරීමේදී මතු වන ගැටලු**

1. ජනගහනය අධික වීම
2. එක් ස්ථානයකට එක්රැස්වීමේ අපහසුතා තිබීම
3. මිනිසාගේ අවශ්‍යතා සංකීර්ණ වීම
4. වර්තමාන පාලන කටයුතු සංකීර්ණ ස්වභාවයක් ගැනීම

වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදය

මහජනතාව විසින් තෝරා පත් කර ගනු නියෝජිතයන් මගින් පාලන කටයුතු සිදු කිරීම වක්‍ර ප්‍රජාතන්ත්‍රවාදයයි.නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ,නියෝජ්‍ය ප්‍රජාතන්ත්‍රවාදය ලෙස ද හඳුන්වයි.

- **ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක මූලික ලක්ෂණ**

1. නීතිය උත්තරීතර කොට සැලකීම
2. ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුකූලව පාලන කටයුතු සිදු කිරීම
3. නිදහසේ අදහස් ප්‍රකාශ කිරීමට ඉඩ ප්‍රස්ථා හිමි වීම
4. නිදහස් ජන මාධ්‍ය පැවතීම
5. නිදහස , සමානාත්මතාව , හා අයිතිවාසිකම් හිමි වීම
6. බහුතර කැමැත්ත මත තීරණ ගැනීම
7. සර්වජන ඡන්ද බලය ක්‍රියාත්මක වීම
8. මහජන ඡන්දයෙන් ආණ්ඩු සහ පාලකයන් පත් කර ගැනීම
9. රට ඡන්ද කොට්ඨාසවලට බෙදා තිබීම
10. නීතිය ඉදිරියේ සියලු ම දෙනා එක හා සමානව සැලකීම
11. බහුතර නියෝජිතයන් සංඛ්‍යාවකගේ සහය ලැබෙන දේශපාලන පක්ෂය හෝ කණ්ඩායම ආණ්ඩු බලය දැරීම
12. නිදහස් හා සාධාරණ මැතිවරණ පැවැත්වීම
13. ආණ්ඩු පක්ෂයක් හා විරුද්ධ පක්ෂයක් පැවතීම
14. ස්වාධීන අධිකරණ පද්ධතියක් රට තුළ ක්‍රියාත්මක වීම
15. තරගකාරී පක්ෂ ක්‍රමයක් පැවතීම

- **ප්‍රජාතන්ත්‍රවාදයේ සාර්ථකත්වය තීරණය වීම කෙරෙහි බලපාන සාධක**

1. ජනතාවගේ දේශපාලන දැනුම සහ අවබෝධය ඉහළ මට්ටමක පැවතීම
2. ජනතාව පාලකයන් තෝරා පත් කර ගැනීමේදී බුද්ධිමත් තීරණ ගැනීම
3. කැපවීමෙන් කටයුතු කරන අවංක සහ උදාර නායකත්වයක් පැවතීම
4. රට තුළ යහපත් ආර්ථික මට්ටමක් පැවතීම
5. ජනමාධ්‍ය නිදහස ක්‍රියාත්මක වීම
6. රට තුළ නීතියේ ආධිපත්‍යය පැවතීම
7. ආණ්ඩුවේ කාර්ය පැහැදිලිව හඳුනා ගත හැකි වන පරිදි බෙදා වෙන් කර තිබීම
8. ප්‍රබල විරුද්ධ පක්ෂයක් තිබීම

- **නියෝජන ප්‍රජාතන්ත්‍රවාදය ක්‍රියාත්මක වන රටවල්**

ශ්‍රී ලංකාව
ඉන්දියාව
ජපානය
එක්සත් රාජධානිය
ප්‍රංශය
ස්විට්සර්ලන්තය
ඇමෙරිකා එක්සත් ජනපදය
කැනඩාව

- **ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක පුරවැසියෙකු සතු අයිතිවාසිකම් හා බැඳුණු යුතුකම්**

**පුරවැසියෙකු සතු අයිතිවාසිකම්**

1. ජීවත් වීමේ අයිතිය
2. නමක් හා ජාතියක් ලැබීමට ඇති අයිතිය
3. අධ්‍යාපනය ලැබීමට ඇති අයිතිය
4. නීත්‍යානුකූල රැකියාවක යෙදීමට ඇති අයිතිය
5. තමන් කැමති ආගමක් ඇදහීමට ඇති අයිතිය
6. පාලකයන් තෝරා ගැනීමට ඇති අයිතිය
7. තමන් කැමති ස්ථානයක ජීවත් වීමට ඇති අයිතිය
8. තමන් කැමති දේශපාලන පක්ෂයකට ඡන්දය දීමේ අයිතිය
9. වෘත්තීය සමිතිවලට බැඳීමේ අයිතිය

- **පුරවැසියෙකු සතු යුතුකම්**

1. හොඳින් අධ්‍යාපනය ලැබීම
2. වැඩිහිටියන්ට සැලකීම
3. පරිසරය පිරිසිදුව තබා ගැනීම
4. පොදු දේපළ සුරැකීම
5. සංස්කෘතික උරුම රැක ගැනීම
6. නීතිරීතිවලට අවනත වීම හා පිළිපැදීම
7. රජය මගින් පනවනු ලබන බදු මුදල් නියමිත පරිදි ගෙවීම
8. පොලීසිය සහ ආරක්ෂක හමුදාවලට සහාය වීම
9. ජාතික සමගිය පෝෂණය කිරීම

- **මෙම සටහන ඔබේ පුරවැසි පොතට ඇතුළත් කරගෙන ඔබේ පුරවැසි පෙළ පොතේ 66 -76 දක්වා කොටස හොඳින් අධ්‍යයනය කොට 3.1 , 3.2 , 3.3 යන ක්‍රියාකාරකම් කරන්න.**

ජී.එල්. වත්සලා

ර/නිවි/සුමන ම.ම.වි.